038

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපනඥයින් සඳහා වන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2008

**ESP 2267 - ප්‍රාථමික තලය සඳහා සිංහල භාෂාව ඉගැන්වීම**

කාලය - පැය තුනයි.

---

දිනය - 2008.05.29 වේලාව - පෙ.ව. 09.30 - ප.ව.12.30 දක්වා

---

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

01. 'භාෂාවක් ඉගෙනීම වෙනත් විෂයයක් ඉගෙනීමට වඩා බෙහෙවින් වෙනස් වේ. භාෂා හැකියා දුර්වල ළමයින් තුළ නිර්මාණශීලී භාවයත්, සංවේදී භාවයත්, සෞන්දර්යකාමී භාවයත් අඩු වනවා පමණක් නොව ඔවුනට පාසලේ ඉගෙනුම ද ප්‍රියජනක නොවන්නට පුළුවන.'

ඉහත ප්‍රකාශනයට අනුව, ප්‍රාථමික අධ්‍යාපන අවධියේ ළමුන් පහත දැක්වෙන නිපුණතා කරා ළඟා කරවීම සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළයුතු අන්දම සාකච්ඡා කරන්න.

අ. කවි, ගී, කතන්දර අසා සහ කියවා රස විඳියි.
ආ. පොත්පත් කියවා තේරුම් ගනියි, රස විඳියි.
ඇ. තම අත්දැකීම් වාර්තා කිරීම හා අදහස් නිර්මාණාත්මකව ප්‍රකාශ කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
ඈ. සමූහයක් ඉදිරිපිට තම අදහස් සුහදව, නිරවුල්ව හා ආචාරශීලීව ඉදිරිපත් කරයි.

(ලකුණු 33)

02. ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා ඉගැන්වීම් ක්‍රියාවලියේදී පරමාර්ථ, පොදු අරමුණු හා සුවිශේෂ අභිමතාර්ථ තීරණය කිරීම සිංහල භාෂා ගුරුවරයකුට වැදගත් වන්නේ ඇයිදැ'යි විමසන්න.

(ලකුණු 33)

03. i. නව ප්‍රාථමික විෂය මාලාවෙන් දක්වා ඇති "තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ" ඇති වැදගත්කම නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

ii. ප්‍රාථමික පාසලේ II වන හා III වන ප්‍රධාන අවධිවල ළමයින් තක්සේරු කිරීම සඳහා සම්භවන හා සම්පිනිඩිත තක්සේරු කිරීම යොදාගත හැකි අවස්ථා දෙකක් නිදසුන් සහිතව දක්වන්න.

(ලකුණු 18)

04. තුන්වන ප්‍රධාන අවධියේ සිසුන්ගේ කථන කුසලතා සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවක් පහත දැක්වේ.

'අවස්ථානුකූලව ආචාරශීලීව කතා බහ කරයි. හැසිරෙයි.' මෙම නිපුණතාව සිසුන්ට අත්පත් කර දීමේදී

i. ගුරුවරයකු විසින් අවධානයට ලක් කළයුතු කරුණු මොනවාදැ'යි විස්තර කරන්න.

(ලකුණු 09)

ii. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iii. එම නිපුණතාව ප්‍රවීණතා මට්ටමට පැමිණ ඇතැ'යි තීරණය කරන නිර්ණායක කවරේද ?

(ලකුණු 08)

iv. එම නිපුණතාව ප්‍රවීණතා මට්ටමට නොපැමිණි සිසුන් පිළිබඳව ඔබ ක්‍රියාත්මක වන්නේ කෙසේ ද?

(ලකුණු 08)

05. i. නව ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්ට අනුව පළමුවන ශ්‍රේණියට පිවිසෙන දරුවන් හඳුනාගැනීම සහ ඔවුන්ට සහාය වීම සඳහා දැනට ක්‍රියාත්මක වන වැඩ සැලැස්ම සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 15)

ii. එම දරුවන්ට හිතකර වැඩවලින් යුත් පංතිකාමර පරිසරයක් සංවිධානය කිරීමේදී පළමුවන ශ්‍රේණියේ ගුරුවරයාගේ භූමිකාව විභාග කරන්න.

(ලකුණු 18)

06. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ පළමු හා දෙවන ප්‍රධාන අවධිවලදී ළමයින්ගේ ලිවීමේ යාන්ත්‍රික දක්ෂතා වර්ධනය කිරීමෙන්, තුන්වන ප්‍රධාන අවධියට ප්‍රවේශවීමේදී ඔවුන්ගේ ලිවීමේ නිර්මාණාත්මක දක්ෂතා වර්ධනයට වැඩි අවධානය යොමු කිරීම පහසු වේ. මේ පිළිබඳව ඔබගේ අදහස් නිදසුන් ඇසුරෙන් විවේචනාත්මකව ඉදිරිපත් කරන්න.

(ලකුණු 33)

- හිමිකම් ඇවිරිණි. -